# නූතන කවිය කෙරෙහි බෞද්ධ දාර්ශනික සංකල්පයන්හි ආභාසයඃ සිරි ගුනසිංහ සහ නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණ ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක්

පී.කේ.ඒ.කේ.ඉන්ද්‍රරත්න[1], ඒ.ඕ.එම්.ටී.එල්. නානායක්කාර[2]

## හැඳින්වීම

මිනිස් හදවතේ පහළ වන අනුභූති පූර්වක භාවයන් ආකාස්මික ව මුදාහැරීම කවියක ආරම්භය යි. බෞද්ධ දර්ශනය යනු, පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල සම්බන්ධය සහිත ව සිත මූලික කරගෙන සියල්ල තේරුම් ගැනීමයි. විඥානය මූලික කරගෙන පටිච්ච සමුප්පාදය සහිත ව සියල්ල අවබෝධ කර ගැනීම බෞද්ධ දර්ශනයෙන් සිදු වේ (ගල්මංගොඩ, 1994). බුද්ධ කාලීන භාරතීය සමාජය බොහෝ දාර්ශනික මතවාදවලින් සමන්විත වූ බව මුල් බුදු සමයට අයත් මූලාශ්‍රය විමසා බැලීමෙන් පැහැදිලි වේ. මුල් බුදු සමය මේ සියලු දාර්ශනික මතවාද හැඳින්වීම සඳහා 'දිට්ඨි' නම් බෞද්ධ දාර්ශනික සංකල්පය භාවිත කර ඇති බව පෙනේ (කරුණාරත්න, 1992). මරණය, අනිත්‍යය, දුක, සතුට, පරිත්‍යාගය යනාදිය බෞද්ධ දාර්ශනික සංකල්ප බුදු දහමේ දී හඳුනා ගත හැකිය. බොහෝ අධ්‍යයනයන්හි දී සිංහල කවියේ සාහිත්‍යමය වටිනාකම ගවේෂණය කර ඇති අතර, නූතන කවියෙන් බුදුන් වහන්සේ හඳුන්වා දුන් බෞද්ධ දාර්ශනික සංකල්ප නිරූපණය වන ආකාරය පිළිබඳ ප්‍රාමාණික පර්යේෂණයක් සිදු වී නොමැත. එම පර්යේෂණ හිඩැස පූර්ණය කිරීමේ අවශ්‍යතාව මත මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ. මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ නූතන කවිය කෙරෙහි බෞද්ධ දාර්ශනික සංකල්පයන් උපස්ථම්භක වී ඇති ආකාරය විමර්ශනය කිරීමයි. සිරි ගුනසිංහ සහ නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණයන්ගෙන් බෞද්ධ දාර්ශනික සංකල්ප නිරූපණය වන්නේ කෙසේ ද? යන මුඛ්‍ය ගැටලුව කේන්ද්‍ර කොටගෙන මෙම අධ්‍යයනය සිදු කෙරේ. නූතන කවිය කෙරෙහි බෞද්ධ දර්ශනයෙහි එන සංකල්පයන්හි ආභාසය විශද වන අයුරු අධ්‍යයනය කිරීම සාහිත්‍යමය වශයෙන් මෙන් ම බෞද්ධ සංස්කෘතිකමය අනන්‍යතාව හඳුනා ගැනීමක් වශයෙන් ද වැදගත් වේ.

## පර්යේෂණ අරමුණු

නූතන කවියෙන් නිරූපිත බෞද්ධ දාර්ශනික සංකල්ප පිළිබඳ සිරි ගුනසිංහ සහ නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණ ඇසුරෙන් විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී බෞද්ධ දාර්ශනික සංකල්පවලින් බෞද්ධ ධර්මය හා දෘෂ්ටිය නිරූපණය කර දක්වන නූතන කවිය පිළිබඳ අධ්‍යයනය කෙරිණි. මෙය නූතන කවිය

1 භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.
2 භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය. amashakavindi83@gmail.com

පිළිබඳ ගුණාත්මක සහ විශ්ලේෂණාත්මක අධ්‍යයනය කි. අන්තර්ගත විශ්ලේෂණ විධික්‍රමය (Content Analysis) ඔස්සේ සිදු කරන මෙම පර්යේෂණය ශුද්ධ සහ පැහැදුම් පර්යේෂණයක් (Explanatory) ද වේ. මෙම පර්යේෂණයේ දී අපේක්ෂා කරනු ලබන්නේ, සිරි ගුනසිංහ සහ නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙන් නිරූපණය වන බෞද්ධ දාර්ශනික සංකල්ප පිළිබඳ ව අධ්‍යයනය කිරීම යි. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ සිරි ගුනසිංහ සහ නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණ යි. මෙම පර්යේෂණයේ ද්විතීයික මූලාශ්‍රය ලෙස බෞද්ධ දාර්ශනික සංකල්ප සම්බන්ධයෙන් රචනා වී ඇති කෘති සහ ශාස්ත්‍රීය ලේඛන මෙන් ම සිංහල කාව්‍ය සහ සාහිත්‍යය සම්බන්ධයෙන් ප්‍රකාශිත කෘති අධ්‍යයනයට ලක් කෙරිණ.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

කවිය වූ කලී මානව ශිෂ්ටාචාරය සතු උත්තම කලා මාධ්‍යයක් බව නොරහසකි. බෞද්ධ දර්ශනයෙහි දී සිදු වන්නේ පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල සම්බන්ධය සහිත ව සිත මූලික කරගෙන සියල්ල තේරුම් ගැනීමයි. සිරි ගුනසිංහ කවියා රචනා කරන ලද 'අබිනික්මන' (1958) කාව්‍ය කෘතියෙහි ඇතුළත් 'මරණය නොසැලී හිමාලයක් මෙන්' පද්‍ය නිමැවුම ඔස්සේ ද නිරූපණය කර ඇත්තේ බෞද්ධ දාර්ශනික සංකල්පයක් වන 'මරණය' පිළිබඳව යි.

"මරණයැ යි කියා ඔබ දුවන්නේ

මරණයේ සෙවනැල්ලටයි" (ගුනසිංහ, 1958)

මෙම පද්‍ය පිළිබඳ ව දීපචන්ද්‍ර අබේසිංහ විසින් රචනා කරන ලද 'සිරි ගුනසිංහ සහ නූතන සිංහල කාව්‍යය' (1999) පිළිබඳ කෘතියෙහි දක්වා ඇත්තේ මෙවන් අදහසකි. "කාලාන්තරයක් තිස්සේ කවීන් අත නා නා විවරණයන්ට අර්ථ කථනයන්ට භාජනය වූ සංකල්පයකි, මරණය. මරණය කෙරෙහි සචේතනික ගුණය ආරෝපණය කරමින් සිරි ගුනසිංහ එය දෙස නව්‍ය දෘෂ්ටියකින් බලා ඇත" (අබේසිංහ, 1999).

සිංහල කවීන් අතර ප්‍රමුඛ වූ සිරි ගුනසිංහ කවියාගේ 'මස් ලේ නැති ඇට' (1998) නම් වූ ප්‍රථම නිසඳැස් කාව්‍ය කෘතියෙහි අන්තර්ගත 'පෙනෙන අඳුර' නම් වූ පැදි පෙළ ඔස්සේ බෞද්ධ දාර්ශනික සංකල්පයක් වන මරණය පිළිබඳ ව නිරූපණය කළ හැකි ය.

"මුල පිටේ උඩ පතින

කලු අකුරු කනවැලයි..." (ගුනසිංහ, 1998)

මැදි වහර උපයෝගී කර ගනිමින් කාව්‍යකරණයේ නියැලි සිරි ගුනසිංහ නිසඳැස් කවිය නියෝජනය කළ දක්ෂ කවියෙකි. ඔහුගේ 'පෙනෙන අඳුර' නම් වූ කාව්‍ය නිර්මාණයෙහි සියලු සත්ත්වයාට උරුම වන්නා වූ මරණය පිළිබඳ ව සහෘදයා වෙත ජනිත කරලීමට ඔහු සමත් වී තිබේ. ජීවිත යථාර්ථය නිරූපණය කරන මෙම පැදි පෙළ ඔස්සේ කවියා ඔහුට ම අනන්‍ය වූ භාෂා උපක්‍රමයක් වන න,ණ,ල,ළ භේදය ද නොසලකා තම කාව්‍ය නිර්මාණය කර ඇති අයුරු මනාව පසක් වෙයි. මේ නිර්මාණය සඳහා උපයෝගී කරගෙන ඇති 'පෙනෙන අඳුර' නම් වූ මාතෘකාව හෙවත් තේමාව මඟින් කවියා ව්‍යංගාර්ථවත් ව නිරූපණය කර ඇත්තේ ද මිනිසත් භවයේ අස්ථිරසාර

බවයි. මිහිපිට ජීවත් වන ඕනෑම අයෙකු හට නිතැතින් ම උරුම වන මරණය මේ කවිය මඟින් ඉස්මතු කරන්නේ ස්වභාවික ආපදා තත්වයක් වන ගංවතුර හේතුවෙන් පවුල් සිය දහස් ගණනක් පෙනි පෙනීම තම ජීවිතයත්, මරණයත් අතර පොර බදනා සටනක් ලෙස යි. මහ පොළොව දෙදරමින් ඇද හැලෙන වර්ෂාව සමඟ නැඟෙන අකුණුවල හඬ හේතුවෙන් ඇතැම් පුද්ගලයින් ගත කරන ඒ දිනයන් අන්ධ වූ දිනයන් ලෙස නම් කරන්නේ ද ජීවිතයේ අස්ථිරසාර බව තව තවත් සහෘදයා වෙත ඒත්තු ගන්වාලමිනි (අබේසිංහ, 1999). 'කලු අකුරු කනවැල', 'අඳ බවේ අද දවස' යනාදී වාග් මාලාව ඔස්සේ එය මනාව ජනිත වෙයි. තව ද, සිරි ගුනසිංහ කවියාගේ උක්ත කෘතියේ ම සඳහන් වන 'මලවුන්ගෙන්' නම් වූ පැදි පෙළ ඔස්සේ ද බෞද්ධ දාර්ශනික සංකල්පයක් වන මරණය පිළිබඳ ව මෙසේ නිරූපණය කළ හැකි ය.

"පෙම්බර බුද්ධිය,

පඬිකම් ගිනිහුල,

ජීවිත සම්පත පෙන්නාපන්;

පෙන්නාපන් මට" (ගුනසිංහ, 1998)

මෙමඟින් කවියා 'පෙම්බර බුද්ධිය', 'පඬිකම් ගිනිහුල' යන්නෙන් ආමන්ත්‍රණ ස්වරූපයෙන් හුවා දක්වන්නේ දැනුමෙන් සුපෝෂිත වූ යමෙකු සිටී නම්, 'සම්පතක් බඳු වූ මනුෂ්‍යයාගේ වටිනා ජීවිතයේ සතුටක් තිබේ ද? තිබේ නම් එය මට පෙන්වා දෙන්න' යන ආදරණීය වදන් උපයෝගී කර ගනිමිනි. 'සන්තුෂ්ටිය, මගෙ පරම ධනය', 'මගෙ කලු අවතාරය' යන රූපකාර්ථවත්, ව්‍යංගාර්ථවත් වදන් ඔස්සේ කවියා පසක් කර ඇත්තේ ද බෞද්ධ දර්ශනයට අනුව, 'සන්තුට්ඨී පරමං ධනං' යන්න යි. එනම්, 'සතුට යනු, ලොව ඇති උතුම් ම ධනය යි' යන්න මෙහි දී නිරූපණය කළ හැකිය. එය මෙම කවියට අනුව, විටෙක 'මගෙ කලු අවතාරය' ලෙස හුවා දක්වා ඇත්තේ මිනිස් දිවිය තුළ සතුට වූ කලී, ඇති වී නැති වී යන දෙයක් හෙයින් එය කලු අවතාරයකට සමාන කර ඇති බවයි. එය කවියා ඉතා අපූර්වාකාරයෙන් යුතු ව සහෘදයා වෙත හුවා දක්වා ඇති අයුරු මෙහි දී ගම්‍යමාන කළ හැකිය.

සිරි ගුනසිංහගේ 'ආලකමන්දාව' (1998) නම් සුවිශේෂ කාව්‍ය නිර්මාණයේ අන්තර්ගත 'දෙවියෝ' නම් පද්‍ය නිමැවුම ඔස්සේ 'දානය' නම් සංකල්පය නිරූපණය කර ඇත්තේ භෞතික වස්තු පරිත්‍යාගයක් ලෙස නොව, අභ්‍යන්තර භක්තිය, ආත්ම කැපවීම සහ හදවතින් කරන පූජාවක් ලෙස යි.

"මගේ හදවත සැලේ නම්

ඒ මහත් බැති දහරාව ගැලීමයි

ඒ මගේ දානයයි" (ගුනසිංහ, 1998)

මෙහි 'දානය' යනු, දේපළ වස්තු පරිත්‍යාගයක් නොව, තම හදවත, භක්තිය, ආදරය සහ ශ්‍රද්ධාව සම්පූර්ණයෙන් ම අරමුණකට කැප කිරීමකි. 'මගේ හදවත සැලේ නම්' යනුවෙන් කවියා නිරූපණය කර ඇත්තේ, තමාගේ සිත තුළ ඇතිවන ගැඹුරු භක්තිය හා ආත්මීය සංවේදනය යි. පූජනීයත්වය ඉදිරියේ ඇතිවන චංචලභාවය ආදි සියල්ල 'දානය' ලෙස සලකයි.

බෞද්ධ දාර්ශනික සංකල්ප ප්‍රකාශනය උදෙසා පමණක් නන්දන වීරසිංහ කවියාගේ 'ක්ෂණ නියාම' (2018) කෘතියෙහි අන්තර්ගත කාව්‍ය නිර්මාණ පෙනී නො සිටින බව ඔහු විටෙක අවධාරණය කරයි. මෙම කෘතියෙහි ඇතුළත් 'තාලපුට සිරිත' නම් පද්‍ය නිර්මාණය ඔස්සේ අනිත්‍යතා සංකල්පය මෙන් ම තවත් බෞද්ධ දාර්ශනික සංකල්ප කිහිපයක් ඉස්මතු වන අයුරු හඳුනාගත හැකි ය.

"මල් පිපී වැනී ගිය

වනගතෙහි

වැහි වලා පැහැය දුටු...." (වීරසිංහ, 2018)

උක්ත 'තාලපුට සිරිත' කාව්‍ය නිමැවුම තුළ වෙසෙසින්ම අනිත්‍යතාව, සංසාරය, ඇලීම, නො ඇලීම, සත්ත්ව කරුණාව හා නිහතමානීත්වය යනා දී සංකල්ප අනාවරණය කරයි. මෙහි එන ස්වභාවික සෞන්දර්යයේ පවතින දෑ පවා ඉක්මනින් ම වෙනසට බඳුන් වන බවත් පසක් කරවාලයි. මෙමගින් බෞද්ධ දර්ශනයේ එන "සියලු සංස්කාර අනිත්‍යය යි" යන දහම බෞද්ධයා වෙත අවධාරණය කරයි. නන්දන වීරසිංහ කවියාගේ ඉහත සඳහන් කළ කෘතියේ ම ඇතුළත් වන 'බුදුන් දැකීම' නම් ප්‍රථම නිර්මාණය මේ සඳහා උපයෝගී කර ගත හැකි විශිෂ්ට නිර්මාණයක් ලෙස නිරූපණය කළ හැකිය.

"ගිම් වේගයෙන් මැඬුණු

මහ සමබිමෙහි

උන්වහන්සේ ගේ...." (වීරසිංහ, 2018)

මෙම පද්‍ය නිර්මාණය හුදෙක් ජනප්‍රිය මල් පූජා, සුවඳ දුම් පූජා වැනි ආමිස පූජාවන්හි යෙදෙන්නවුන් කිසිවිට නොහඟින 'ක්ෂණ භාවය' පිළිබඳ ඇඟවීමකි. විසල් බුදු පිළිමයක් අබියස සිදු කෙරෙන මහා සුවඳ දුම් පූජාවක් විෂය කොට ගත් මේ නිමැවුම, එකී පූජාවෙහි සාටෝපවත් සන්දර්ශනාත්මකභාවය ඉක්මවා දැකීමකි. මේ ධූප මේලාව දෙස පසෙකට වී බලා සිටින, කවියේ එන කථකයා, ඉන් අහසට නැඟෙන දුම් රොදෙහි අල්පකාලික පැවැත්ම එහි ක්ෂණික අන්තර්ධාන වීම දකිමින් බුදුන් වහන්සේගේ ධර්මය දකියි. මෙය හුදෙක් පූජා කර්මයන්ට විග්‍රහාත්මක ප්‍රතිචාරයක් නොවන අතර, එබඳු ජනප්‍රිය පූජා විලාස මඟින් ධර්මය දැකීමක් නො සිදු වන අයුරු අඟවන්නකි. තව ද, ක්ෂණ නියාම කෘතියේ අන්තර්ගත 'උන්වහන්සේගේ ගමන' නම් පද්‍ය නිමැවුම ද බෞද්ධ දාර්ශනික සංකල්ප හුවා දැක්වීම සඳහා ඉවහල් වන අගනා පද්‍ය නිර්මාණයකි.

"සරා රිවි තැවුලෙන් පීඩිත

ලුණුවරණ රැක් පෙළ....." (වීරසිංහ, 2018)

මෙහි දී මහත් හුදෙකලා භාවයෙහි ඇලුණු, ධූතාංග දැකීමෙන් බුදුන්ට පමණක් දෙවැනි වූ මහා කාශ්‍යප හිමියන් පිළිබඳ ව නිරූපණය කර දක්වන බව වීරසිංහ කවියා පසක් කරවාලයි. වන ගැබට නො ගොස්, සමාජයෙහි රැඳී සිටින්නැ'යි කරන ඉල්ලීම් කිසිවක් නිසා නො රැඳුණු උන්වහන්සේ ඇතුන්ගේ කුංචනාදයෙන් කම්පිත වනය හා පර්වත මුදුන් ඇසුරට වැඩ, ගෙවා ලූ වීර්යවත් ජීවිතය මේ නිමැවුමෙන් පිළිබිඹු වෙයි. මෙහි දී උන්වහන්සේගේ ගමන සදාකාලික නොව, කාලය හා ස්වභාවය මත පදනම්

ව අතුරුදහන් වන බව පසක් කරවාලයි. 'ඉපල් සිරුරින්, අදිටනින් මේසයක් පතා සිටිනා' යන පැදි පෙළ මඟින් රූපකාර්ථවත් බස නිරූපණයත්, ස්වභාවය තුළ පවත්නා තාවකාලික සම්බන්ධතාවත් විදහා දක්වයි. මේසය මෙන් උන්වහන්සේගේ ගමනත් අනිත්‍ය වන බව නිරූපණය කරයි.

ඒ අනුව සහෘදයාගේ ලෞකික සුවයටත්, ලෝකෝත්තර සුවයටත් ඉවහල් වන පරිදි මෙකී නිර්මාණ ඔස්සේ සපයන බෞද්ධ දාර්ශනික සංකල්ප භාවාත්මකවත්, සංකේතාත්මකවත්, කාව්‍යාත්මකවත් නිරූපණය කිරීමට කවීන් දැක් වූ ප්‍රයත්නය ඉතා අගනේ ය.

**නිගමන හා යෝජනා**

යථෝක්ත කරුණු මඟින් නූතන කවිය කෙරෙහි බෞද්ධ දාර්ශනික සංකල්පයන්හි ආභාසය බලපා ඇති ආකාරය හඳුනාගත හැකි ය. එහි දී ප්‍රධාන පර්යේෂණ ගැටලුව පූරණය කරමින් නූතන කවියෙහි බෞද්ධ දාර්ශනික සංකල්පයන් නිරූපණය වන ආකාරය අනාවරණය කර ගත හැකි විය. මෙම පර්යේෂණයට අනුව නූතන කවියෙන් නිරූපිත බෞද්ධ දාර්ශනික සංකල්ප පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී, සිංහල කවියේ ප්‍රභවය හා ආගමික සබඳතාව විශ්ලේෂණය කිරීම වඩාත් යෝග්‍ය වේ. ලෝකයේ සෙසු කාව්‍ය සම්ප්‍රදායන් මෙන් ම සිංහල කවිය ද එහි ආරම්භයේ පටන් ම ඉතිහාසය, සහ කවි සඳහා ප්‍රස්තුත වූ වස්තුවිෂය හෙවත් අනුභූතිය ප්‍රධාන වශයෙන් ආගමික පසුබිම (විශේෂයෙන් බුදු දහම) සමඟ අවියෝජනීය ලෙස බැඳී පවතින බව නිගමනය කළ හැකි ය.

සමස්තයක් ලෙස ගත් කල, මෙම පර්යේෂණයෙහි "නූතන කවිය යනු, බෞද්ධ දර්ශනය ප්‍රායෝගික ජීවන අත්දැකීම් සමඟ බද්ධ කරමින්, මානව විඥානය පුළුල් කරන ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක්" බව සාර්ථක ව තහවුරු කරගෙන ඇත. ආගමික සංකල්ප, ඍජු බණ දහම් ලෙස ඉදිරිපත් නො කර කාව්‍යෝචිත රූපක, ව්‍යංගාර්ථ සහ සංකේත ඇසුරින් උසස් කලාත්මක නිර්මාණ බවට පත්කිරීමට නූතන කවියා දක්වා ඇති පරිණතභාවය මෙම පර්යේෂණය තුළ ඉතා ශාස්ත්‍රීය මට්ටමකින් විමර්ශනය කර තිබේ. එහෙයින්, නූතන කවිය යනු, බෞද්ධ දාර්ශනික සංකල්ප නිරූපණය කළ හැකි ප්‍රබල සාහිත්‍යාංගයකි. මෙම ක්ෂේත්‍රය සම්බන්ධ ව වැඩිදුර ගවේෂණය කිරීමට රුචි පර්යේෂකයන් හට මෙම විමර්ශනය නව අධ්‍යයන මානයන් සපයන අතර බුදුදහමෙහි එන සිත, චෛතසික සහ මනෝවිද්‍යාත්මක ඉගැන්වීම් නූතන නිදහස් කවියේ ප්‍රතිනිර්මාණය වී ඇති ආකාරය පිළිබඳ ව පුළුල් මනෝවිද්‍යාත්මක ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමට මෙය උපස්ථම්භක වනු ඇත.

**ප්‍රමුඛ පද** - ආභාසය, කවීන්, බුදු දහම, බෞද්ධ දාර්ශනික සංකල්ප, සිංහල කවිය

**ආශ්‍රිත ග්‍රන්ථ**

අබේසිංහ, ආනන්ද (1999). *රසාස්වාදය හා චමත්කාරය.* මහරගම: ස්වර්ණා ද සිල්වා මුද්‍රණය.

අබේසිංහ, දීපචන්දි (1999). *සිරි ගුනසිංහ සහ නූතන සිංහල කාව්‍ය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාරත්න, ඩබ්.එස්. (1992). *බෞද්ධ දර්ශනය සහ චරණය*. මහරගමඃ විදුර ප්‍රකාශකයෝ.

ගල්මංගොඩ, සුමනපාල (1994). *ආදි බෞද්ධ දර්ශනයේ මූලධර්ම විග්‍රහයක්*. කොළඹඃ අභය මුද්‍රණ ශිල්පියෝ.

ගුනසිංහ, සිරි (1958). *අබිනික්මන*. කොළඹ 10ඃ චතුර ප්‍රකාශකයෝ.

ගුනසිංහ, සිරි (1998). *මස් ලේ නැති ඇට*. කොළඹ 10ඃ චතුර ප්‍රකාශකයෝ.

ගුනසිංහ, සිරි (1998). *ආලකමන්දාව*. කොළඹ 10ඃ චතුර ප්‍රකාශකයෝ.

ගුණවංස හිමි, සන්දෙස්සේ (1996). *පිවිතුරු දිවියක සටහන්*. බොරැල්ලඃ තරංජි ප්‍රින්ටර්ස්.

වීරසිංහ, නන්දන (2018). *ක්ෂණ නියාම*. කොළඹ 10ඃ සරසවි ප්‍රකාශකයෝ.